# සන්නිවේදනය හා මධ්‍ය අධ්‍යයනය - 13 ශ්‍රේණිය

## 11 පාඩම - ශ්‍රී ලංකාවේ මාධ්‍ය හා සමකාලීන ප්‍රවණතා

1. ශ්‍රී ලංකාවේ මාධ්‍ය ආරම්භය හා විකාශය සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

    i. පුරාතන ශ්‍රී ලාංකීය සමාජ ක්‍රමයෙහි පැවති සම්ප්‍රදායික සන්නිවේදන ක්‍රම හතරක්

    ii. ශ්‍රී ලාංකීය සන්නිවේදනයේ සන්ධිස්ථානයන් සනිටුහන් කරමින් පහත සඳහන් වර්ෂයන්හිදී බිහිවූ ජනමාධ්‍ය, i. 1860 ii. 1924 iii. 1948 iv.1979 vi.1982

    iii. යටත්විජිත සමයේ දේශීය සන්නිවේදනයට බලපෑ ප්‍රධාන සාධක දෙකක්

    iv. ශ්‍රී ලංකාවට මුද්‍රණ ශිල්පය හඳුන්වා දුන් විදේශීය ජාතිය

    v. සිංහල පරාභව නාටකය, අලකේශ්වර, සිරිසඟබෝ, වීර වික්‍රම නාට්‍ය රචනා කළ ප්‍රවීන නාට්‍ය ශිල්පියා

    vi. වාසනාවන්ත විවාහය, රොසලින් හා ජයතිස්ස නවකතා රචනා කළ නවකතාකරු

    vii. සිංහල නූර්ති ගීත පටිගත කිරීමෙන් මෙරට ඇතිවූ සංස්කෘතිය

    viii. දෙවන ලෝක යුද්ධය විසින් මෙරට ඉතිරි කර ගිය වැදගත්ම සන්නිවේදන ක්‍රමය

    ix. සන්නිවේදනය ක්‍රමය ජන සන්නිවේදනයෙන් පුද්ගල සන්නිවේදනයට විතැන් වීමට බලපෑ ප්‍රධාන සාධකය

    x. සන්නිවේදන වර්ග අතර අතිශය නම්‍යශීලී සන්නිවේදන වර්ගය

2. පහත සඳහන් සංකල්ප කෙටියෙන් හඳුන්වන්න. ඒ අතරින් ගෝලීයකරණ තත්ත්වය ව්‍යාප්ත වීමට බලපෑ සාධක සහ ගෝලීයකරණයේ ප්‍රතිඵල පිළිබඳව ශ්‍රී ලංකාවේ මාධ්‍ය ඇසුරින් විමර්ශනය කරන්න.

    i. මාධ්‍ය අභිසාරිතාව ii. නිර්මහාපරිමාණකරණය iii. නිර්නියාමනය

    iv. පරිභෝජ්‍යකරණය v. භාණ්ඩකරණය vi. වාණිජකරණය

    vii. ගෝලීයකරණය

3. ශ්‍රී ලංකාවේ මාධ්‍ය ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා කුමන අංශයන් ඇසුරින් විග්‍රහ කළ හැකිද?

4. මෙරට මාධ්‍ය තාක්ෂණික ප්‍රවණතාවලට සෘජුවම බලපාන සාධකය කුමක්ද?

5. **'අන්තර්ජාල වස්තු'** යන නව පරිගණක තාක්ෂණික ප්‍රවණතාව මගින් පුද්ගලයාට ඉටුකර ගතහැකි

කාර්යයන් මොනවාද?

6. සන්නිවේදනයේ තාක්ෂණික දියුණුවත් සමග ලාංකීය සන්නිවේදන ක්ෂේත්‍රයේ සිදුවී ඇති නව ප්‍රවණතා හතරක් නම් කරන්න.

7. ප්‍රතිසම (Analog) තාක්ෂණයෙන් සංඛ්‍යාංක (Digital) තාක්ෂණයට පිවිසීමත් සමග ලාංකීය මාධ්‍ය ක්ෂේත්‍රයේ සිදුවූ වෙනස්කම් මොනවාද?

8. ඒක මාධ්‍ය (Mono Media) සහ බහු මාධ්‍ය (Multi Media) වෙන වෙනම හඳුන්වන්න. බහු මාධ්‍යවලට පිවිසීම නිසා ග්‍රාහකයාට ඇති වී ඇති වාසි මොනවාද?

9. අනාගතයේ දී ඇති විය හැකි වෙතැයි අපේක්ෂිත නව මාධ්‍ය තාක්ෂණික ප්‍රවණතා මොනවාද?

10. මාධ්‍ය ආයතන වශයෙන් ගත්කළ ශ්‍රී ලාංකීය මාධ්‍ය ක්ෂේත්‍රය තුළ දැකිය හැකි නව ප්‍රවණතා මොනවාද?

11. ශ්‍රී ලාංකීය නූතන මාධ්‍ය ප්‍රවණතා අතර මාධ්‍ය සංදේශයන්හි අන්තර්ගතයේ දැකිය හැකි ප්‍රධාන ලක්ෂණ හතරක් නම් කර ඒවා උදාහරණ සහිතව විස්තර කරන්න.

12. සමකාලීන මාධ්‍යයේ විකාශය හා වර්ධනය හේතුකොටගෙන ග්‍රාහක භූමිකාව වෙනස් වී ඇත්තේ කෙසේද? විමර්ශනය කරන්න.

***'අත් නොහරින්න,***

***අද දින අසීරුය. හෙට ඊටත් වඩා අසීරු විය හැකිය.***

***නමුත්........ අනිද්දා හිරු උදාවනු නිසැකය.'***